**කොච්චිකඩේ පාලම යළි ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2017**

-----------------------------------------------------------------------

කොච්චිකඩේ පාලම යළි ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරනු ලැබීය.මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ඔස්ට්‍රියාවේ රෙයිෆසන් ජාත්‍යන්තර බැංකුව ඒජී අතර 2016 ජනවාරි 13 දින එළඹි ණය ගිවිසුම යටතේ ක්‍රියාත්මක විය.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ පැලියගොඩ පුත්තලම මාර්ගයේ කොච්චිකඩේ පිහිටි අංක 38/3 පාලම ප්‍රතිස්ථාපනය කිරීමයි.එය පැලියගොඩ පුත්තලම සම්බන්ධ කරන මාර්ගයේ යටිතල පහසුකම් අඛණ්ඩව පවත්වා ගැනීමට ප්‍රමාණවත් දායකත්වයක් ලබා දීම සඳහා මාර්ගයේ රථ වාහන ප්‍රමාණය දරා ගැනීමට ව්‍යුහාත්මකව දුර්වල හා යෝග්‍ය නොවේ.ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1735.62 කට සමාන යුරෝ මිලියන 10.85 ක් වූ අතර ඉන් රු. මිලියන 1392 කට සමාන යුරෝ මිලියන 8.70 ක් මූල්‍යායනය කිරීම සඳහා ඔස්ට්‍රියාවේ රෙයිෆසන් ජාත්‍යන්තර බැංකුව ඒජී එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 ජූලි 24 දින ආරම්භ කර 2019 ජනවාරි 24 දිනට නිම කිරීමට අපේක්ෂා කරන ලදි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත්, වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීමත් කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණනයේ විෂයපථය

----------------------

විගණනය පුළුල් ලෙස ආවරණය කළ හැකි පරිදි එහි විෂයපථය හා ප්‍රමාණය සහ පරීක්ෂණයේ ප්‍රමාණය මා හට ලබාගත හැකි කාර්යමණ්ඩලය,කාලය සහ අනෙකුත් සම්පත්වල ප්‍රමාණය මත සිදු කරන ලදි.මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණවත් සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට අනුකූලව විගණනය සිදු කරනු ලැබීය.මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන සංඛ්‍යා සහ හෙළිදරව් කිරීම්වලට සහය වන සාක්ෂි පරීක්ෂා කිරීම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතය පිළිබඳ තක්සේරුව සහ කළමනාකරණය විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඇගයීම විගණනයට ඇතුළත් වේ.මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට මාගේ විගණනයේ අරමුණට අවශ්‍ය ප්‍රමාණවත් තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන තිබෙන බව.මෙම පරීක්ෂණයට පද්ධති පරීක්ෂා කිරීම සහ පාලනය,ගනුදෙනු,වත්කම්,වගකීම් පිළිබඳ නිරීක්ෂණයන් හා පහත දක්වා ඇති ඒවා තක්සේරු කිරීමට අවශ්‍ය විය හැකි යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපාතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩිමනත් මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැඟීමට පත්වන ලෙස සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) වියාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යව බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2 මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති ගැලපීම් වලින් පැන නගින බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

--------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදුකරන ලදි.

(අ) ව්‍යාපෘති ලියකියවිලිවලට අනුව ණය දෙන ආයතනය විසින් ලබා දෙන මුළු ප්‍රතිපාදනයෙන් සියයට 35 ක ප්‍රතිශතයක් ප්‍රදානයක් ලෙස සලකා කටයුතු කිරීම අවශ්‍ය වේ.කෙසේවෙතත් ව්‍යාපෘතිය විසින් එය ලද ප්‍රදානයක් ලෙස හඳුනාගැනීමට, වෙන්කර තැබීමට හා මූල්‍ය වාර්තාවන් වල පෙන්නුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) රු. මිලියන 1.51 ක වටිනාකමින් යුතු කළ වැඩ 2017 දෙසැම්බර් 31 දිනට ගිණුම්වලට ගෙන නොතිබුණි. සහ එහි ප්‍රතිඵලයක් ලෙස කෙරීගෙන යන වැඩ ගිණුමේ සහ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ගිණුමේ පෙන්වන වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුකර පෙන්වා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂයේ අරමුදල් උපයෝජනය හා 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් පිළිබඳ වැදගත් සංඛ්‍යාමය දත්ත සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම් | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | යුරෝ මිලියන | රු. මිලියන | රු. මිලියන | යුරෝ මිලියන | රු. මිලියන | යුරෝ මිලියන | රු. මිලියන |
| රෙයිෆසන් ජාත්‍යන්තර බැංකුව | 8.70 | 1,392.00 | 1,360.00 | 3.92 | 627.73 | 6.31 | 1,007.41 |
| ශ්‍රී ලංකා රජය | 2.15 | 343.62 | 40.00 | 0.13 | 20.45 | 0.87 | 134.45 |
| | **10.85** | **1,735.62** | **1,400.00** | **4.05** | **648.18** | **7.18** | **1,141.86** |

**3.2 භෞතික ප්‍රගතිය**

ලබාගත් තොරතුරු අනුව ,ටර්න් කී කොන්ත්‍රාත්තුව යටතේ පාලමේ කොන්ත්‍රාත් වැඩ වලින් සියයට හැට පහක ප්‍රතිශතයක් 2017 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබුණු අතර ඒ සඳහා ඔස්ට්‍රියන් කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණේ සිය කැමැත්තෙන් දෙන ලද යෝජනාවක් ආකාරයටය.ප්‍රවර්තන වර්ෂය අවසන් වන විට සියයට හැටක ප්‍රතිශතයක කොන්ත්‍රාත් වැඩ ලඟා කර ගැනීමට ඉලක්ක කර තිබුණි.කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරු විසින් යොමු කරන ලද කාර්යසාධන වාර්තාවල කොන්ත්‍රාත් ගිවිසුමේ (ඇ) හා (ඉ) කොටස් යටතේ ලබා දිය යුතු තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පවතින පාලම පිහිටි ස්ථානයෙන් වෙනත් ස්ථානයක නව පාලම ඉදිකිරීමට තීරණය කර තිබුණත්, අරමුණ සඳහා භූමියේ යෝග්‍යතාවය,පාලමේ මෝස්තරය සහ මංතීරු සංඛ්‍යාව නිශ්වය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොමැත.

**3.4 ව්‍යාපෘතියේ ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාකාරකම්**

ව්‍යාපෘතිය පාලම ඉදිකිරීම සඳහා ඉඩම් කැබලි 09 ක් අත්පත් කරගෙන තිබීම සහ 2017 දෙසැම්බර් 31 දිනට වන්දි මුදල් වටිනාකම ලෙස රු. මිලියන 103.4 ක් සහ පොලී වටිනාකම ලෙස රු. මිලියන 11.9 ක මුදලක් ගෙවා තිබුණි.කෙසේ වෙතත් ඉඩම් කැබලිවල අයිතිය ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ එම දිනය වන විටත් පවරා නොතිබුණි.